# ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි භෝග අපනයනයේ මෑතකාලීන ප්‍රවණතා

පී.එල්.ඕ. අශානි, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර
oshika25@gmail.com

පී.ජී.එන්.පී. පෙරේරා, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර
ganpperera@gmail.com

**සංක්ෂේපය**

නිදහස ලබන අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ නවීන වැවිලි බෝග හා යැපුම් කෘෂිකර්මය යන ද්විත්ව ලක්ෂණයන්ගෙන් සමන්විත වූ සම්භාව්‍ය ආර්ථිකයක් උරුම වී තිබිණ. මුලදී යැපුම් අරමුණු සහිතව මෙරට නිෂ්පාදන ක්‍රියාවලිය සිදු වුව ද පසුකාලීනව විදේශීය ආයෝජන මෙරටට ඇදී ඒම ත් සමග විදේශීය වෙළෙඳපළ ප්‍රමුඛ වූ අපනයන මත රැඳුණු ආර්ථිකයකට ශ්‍රී ලංකා ආර්ථිකය පය තැබීය. 1977 හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ අපනයන ශක්‍යතාවය පුළුල් වූ අතර ක්‍රමයෙන් කාර්මික නිෂ්පාදන අපනයනය කෙරෙහි වැඩි වැදගත්කමක් හිමි විය. එබැවින් කෘෂි ආර්ථිකයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ කෘෂි අපනයන සඳහා හිමි වී ඇති ස්ථානය පිළිබඳ විමසීම වැදගත් වේ. මන්ද සංවර්ධිත හෝ සංවර්ධනයවන ඕනෑම රටක සංවර්ධනයේ මූලාරම්භය වනුයේ කෘෂි අංශයේ දියුණුවයි. එබැවින් කෘෂි කාර්මික ආර්ථිකයකට හිමිකම් කියන ශ්‍රී ලංකාව වැනි රටක් සිය කෘෂි නිෂ්පාදන අපනයනය තුළින් ආර්ථික වශයෙන් ලබා ඇති ප්‍රගතිය විමසිය යුතු ය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි අපනයන භෝග ලෙස තේ, පොල් හා රබර් හැඳින්වෙන අතර එයට අමතරව ගම්මිරිස්, කුරුඳු හා කෝපි වැනි සුළු අපනයන භෝගයන් ද කෘෂි අපනයන භෝග ගණයෙහි ලා සැලකේ. ඒ අනුව ප්‍රධාන කෘෂි අපනයන භෝග නිෂ්පාදනයේ ප්‍රවණතාවන්, එය ශ්‍රී ලංකා ආර්ථිකයට කෙසේ දායක වී ඇත් ද සහ කෘෂි අපනයන භෝග නිෂ්පාදනය මුහුණ දෙන අභියෝග මොනවා ද යන්න විමසීම මෙමගින් අපේක්ෂා කරනු ලැබේ.

**මුඛ්‍ය පද :-**කෘෂි අපනයන භෝග, සංවර්ධනය

## හැඳින්වීම

ප්‍රධාන කෘෂි අපනයන භෝග අතර තේ නිෂ්පාදනය සඳහා හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. කෝපි වගාවේ පිරිහීමෙන් පසු ආරම්භ වූ තේ වගාව එංගලන්ත තේ වෙළෙඳපොළත් සමඟ වර්ධනය වූ අතර එමඟින් ලංකා ආර්ථිකයේ නව යුගයක් ආරම්භ විය. 1860 දී ජේම්ස් ටේලර් මහතා විසින් මුල් වරට ලංකාවේ වාණිජ්‍ය තේ වගාව අරඹන ලදී. තේ වගාව හා ප්‍රවාහනය ඇසුරින් බැංකු, රක්ෂණ හා මූල්‍ය සමාගම් බිහිවීමෙන් ලංකාවේ ආර්ථික ප්‍රසාරණයක් ද ඇති විය. තේ නිර්යාත කර උපයන ආදායමෙන් ලංකාවට අවශ්‍ය දෑ ලෝක වෙළඳපොළෙන් මිල දී ගත හැකිවන පරිදි ආර්ථිකය වෙනසකට ද ලක් විය. 19 වන ශත වර්ෂය අවසාන කාලයේ පටන් ලංකාව ජාත්‍යන්තර ආර්ථිකයට සම්බන්ධ වී තිබෙන්නේ මූලික වශයෙන් තේ වගාව හේතු කොට ගෙන යි. ඌන සංවර්ධිත රටවලට අවාසිදායක වූ වර්තමාන ජාත්‍යන්තර වෙළඳ රටාවට ලංකාව සම්බන්ධ වීමත් එමගින් ආර්ථිකය වෙනස් වීමටත් තේ කර්මාන්තය හේතු විය (ඊරියගම, 1997). ලංකාවේ ව්‍යාපාරික වැවිලි අතරින් තේ වගාව විදේශ විනිමය උපයන ප්‍රධාන

මාර්ගයක්වන අතර එය රටේ රැකී රක්ෂා සපයන ප්‍රධාන මාර්ගයක් ද විය. ශත වර්ෂ එකහමාරකට අධික කාලයක් තුළ ශ්‍රී ලංකාව තේ නිෂ්පාදනයේ නියැලෙමින් ලබාගත් කුසලතාවය නිසා ලෝක වෙළෙඳපොළේ ඉස්තරම්ම තේ අපනයන රටක් ලෙස කීර්ති නාමයක් ශ්‍රී ලංකාව හිමිකර ගෙන ඇත.

1877 දී පමණ රබර් වගාව ශ්‍රී ලංකාවට හඳුන්වා දෙනු ලැබිණි. 1890 පමණ වනවිට ලංකාවේ රබර් වගාව වාණිජ්‍ය භෝගයක් වශයෙන් ව්‍යාප්ත විය. මෙකල යුරෝපයේ ඇති වූ මෝටර් රථ කර්මාන්තයේ දියුණුව නිසා රබර් සඳහා ඉල්ලුම වැඩි විය. එමෙන් ම විදේශීය මෙන් ම දේශීය ආයෝජනය ද රබර් වගාවට යොමු විය (අපේ උරුමය, 2015). 20 වන සියවසේ මුල් අවධිය වනවිට වාණිජ්‍ය වගාවක් ලෙස රබර් වගාව දෙවැනි වූයේ තේ වලට පමණි. රබර් හා ඒ ආශ්‍රිත නිපැයුම් විදේශීය රටවලට අපනයනය කිරීම තුළින් විශාල විනිමය ප්‍රමාණයක් ලංකාවට ලබාගත හැකි විය. පසුකාලීනව රබර් කර්මාන්තය ආශ්‍රිත විශාල රැකියා අවස්ථා වතු හා ග්‍රාමීය ජනතාවට ලැබිණි. මෙම රැකියා අවස්ථා කිරි කැපිමේ සිට අපනයනය කිරීම දක්වා බිහි වී ඇත. එමෙන් ම මෑතකාලින රබර් නිපැයුම් සඳහා පැවති ආකර්ෂණීය මිල ගණන් හේතුවෙන් කුඩා හා විශාල වතු හිමියන්ට විශාල ආදායමක් ද අත් කර ගත හැකි විය. රබර් වගාව හේතුවෙන් රටේ පැවති රැකී රක්ෂා ප්‍රශ්නයට යම් විසඳුමක් වූ අතර රටේ ආර්ථිකයට හා ආදායම් විෂමතාවය අඩු කිරිමට එය ඉවහල් විය.

දෙවැනි වගාවක් ලෙස ආරම්භ කළ පොල් වගාව ඉතා කෙටි කාලයක් තුළ සීඝ්‍ර ව්‍යාප්තියක් ඇති විය. ශ්‍රී ලංකාවේ වයඹ , බස්නාහිර, දකුණ යන පළාත්වල පොල් වගාව සීඝ්‍රයෙන් පැතිර ගියේ ය. ශ්‍රී ලංකාවේ කෘෂි භූමි ප්‍රමාණයෙන් 28% ක් පමණ පොල් වගාව සඳහා යොදා ගෙන ඇත (අපේ උරුමය, 2015). පොල් නිෂ්පාදනයෙන් වැඩි කොටසක් දේශීය පරිභෝජනය සඳහා යොදා ගන්නා අතර ජන සංඛ්‍යාවේ වර්ධනයත් සමඟ ශ්‍රී ලංකාවේ ගෘහස්ථව කෙරෙන පොල් පරිභෝජනය දිනෙන් දින වැඩිවීමේ ප්‍රවණතාවක් දැකගත හැක.

බ්‍රිතාන්‍යයන්ගෙන් ශ්‍රී ලංකාව නිදහස ලබන අවධිය වනවිට ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට, විදේශ විනිමය ඉපයුම්වලට, සේවා නියුක්තියට සහ රජයේ ආදායමට වතු වැවිලි අංශයේ දායකත්වය ඉහළ මට්ටමක පැවතුණි. එමෙන් ම ලංකාව තේ, පොල් සහ රබර් ඇතුළු මූලික භාණ්ඩ අපනයනය කර ලැබෙන ආදායමෙන් ලංකාවට අවශ්‍යය කාර්මික භාණ්ඩ, අතරමැදි භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කරන, ආනයන අපනයන මත දැඩි රැඳියාවක් දක්වන ආර්ථිකයක් බවට පත් වී තිබුණි. නිදහසෙන් පසුව බලයට පත්වූ රජයන් විසින් ද වතු වැවිලි අංශය මත දැඩි රැඳියාවක් දක්වමින්, පැවති ආර්ථික ව්‍යුහය එතරම් වෙනස් කිරීමට උත්සාහ නොකරන ලදී. එනිසා නිදහසින් පසුව 1970 ගණන්වල මුල් කාලය දක්වා වතු වැවිලි අංශයේ වර්ධනයක් සිදු විය (හෙට්ටිආරච්චි, 2007). ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි අපනයන භෝග වන තේ, පොල් සහ රබර් නිෂ්පාදන මෑතකාලීනව මෙරට ආර්ථිකයට කෙතරම් දායකත්වයක් දක්වා ඇත්දැ යි විමසිය යුතු ය.

## ප්‍රධාන කෘෂි භෝග අපනයනයේ මෑතකාලීන ප්‍රවණතා

ප්‍රධාන කෘෂි භෝග අපනයනයේ මෑතකාලීන ප්‍රවණතා හඳුනාගැනීමේදී අතීත අපනයන තත්වයන් පිළිබඳව සන්සන්දනය කිරීම ද වැදගත් වේ. එනම් 1992 වනවිට ශ්‍රී ලංකාවේ තේ, රබර් හා පොල් යනාදී වැවිලි ආර්ථිකයේ නිපදවන භාණ්ඩවල නිර්යාත සඳහා විශාල වශයෙන් බදු අයකිරීමක් දැකිය හැකිව තිබුණි. එහෙත් මෙම සියලු ම නිර්යාත වැවිලි භෝග සඳහා වූ බදු 1992 දී අහෝසි කළ අතර ඉන් පසු ක්‍රියාත්මක වූයේ ඉතා සුළු ප්‍රමාණයක අධිභාරයක් සහ සෙස් බද්ද කි. මෙමගින් ලැබෙන ආදායම රජය නැවත වතාවක් තෝරාගත් සානුබල සැපයීම සඳහා නැවත වගා කිරීමේ සහනාධාර ලෙස ද අළුත් නිර්යාතයන්ට තම ව්‍යාපාර ආරම්භ කිරීමට සහනාධාර ලෙස ද ලබාදෙන ලදී. මෙලෙස නිර්යාත සහනාධාර ලබාදෙන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලය සඳහන් කළ හැක. මෙමගින් විදේශයන්ට තේ අලෙවි කිරීමට විවිධ සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කරනු ලබයි (සේනානායක, 2008). 1992 වනවිට පැවති මෙම බාධක ඉවත් වෙමින් වර්තමානය වනවිට ප්‍රධාන කෘෂි අපනයන භෝග නිෂ්පාදන හා අපනයන ක්‍රියාවලිය සඳහා වඩාත් සහනදායී ක්‍රම හඳුන්වා දීමේ ප්‍රවණතාවයක් දැකිය හැකි බවයි. පහත දැක්වෙන වගුව සහ ප්‍රස්තාරය මගින් ප්‍රධාන කෘෂි භෝග අපනයනයේ මෑතකාලීන හැසිරීම හඳුනාගත හැක.

වගුව 01:ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි භෝග අපනයන ආදායම (රුපියල් මිලියන)


| වර්ෂය | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකාර්මික අපනයන | 182526.7 | 213132.1 | 210092.1 | 260632.3 | 279466.4 | 297714.6 | 333942.3 | 364762.1 |
| තේ | 113564.7 | 137605.6 | 136194.1 | 162792.9 | 164869.2 | 180428.7 | 199446.2 | 212588.0 |
| රබර් | 12065.8 | 13534.5 | 11326.8 | 19580.5 | 22811.3 | 15725.9 | 9194.1 | 5916.1 |
| පොල් | 14226.5 | 15728.4 | 18634.5 | 18728.1 | 29393.7 | 26593.9 | 26488.0 | 46517.1 |

මූලාශ්‍රය :ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2014

අංක 01 වගුවෙන් පෙන්නුම් කරන ආකාරයට සමස්ත කෘෂිකාර්මික අපනයන ආදායම 2007 සිට 2014 කාලය තුළ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. 2007 වසරට සාපේක්ෂව 2014 වනවිට අපනයන ආදායම රුපියල් මිලියන 182235.4 කින් වර්ධනය වී ඇත. මේ අතුරින් තේ අපනයන ආදායම විශේෂත්වයක් ගනු ලබන අතර පොල් සහ රබර් අපනයන ආදායමට සාපේක්ෂව තේ අපනයන ආදායම සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. තේ අපනයන ආදායම 2007 වසරට සාපේක්ෂව 2014 වසරේ දී රුපියල් මිලියන 99023.3 ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. එමෙන්ම පොල් අපනයන ආදායම ද 2007 වසරේ සිට 2014 වසර දක්වා වසර අටක කාලය තුළ තරමක වර්ධනයක් පෙන්නුම් කරන අතර එය 2007 වර්ෂයට සාපේක්ෂව 2014 වන විට රුපියල් මිලියන 32290.6 ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. එහෙත් රබර් අපනයන ආදායම තේ සහ පොල්

අපනයන ආදායමට සාපේක්ෂව 2014 වසර වන විට පහළ යෑමක් පෙන්නුම් කර ඇත. එමෙන්ම මෙම වසර අටක කාලය තුළ රබර් අපනයන ඉපයුම්හි උච්චාවචනයක් පැවති අතර 2007 වසරට සාපේක්ෂව 2014 වන විට රබර් අපනයන ආදායම රුපියල් මිලියන 6149.7 ක පසුබෑමක් දක්නට ලැබේ.

ප්‍රස්තාර 01:ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි නිෂ්පාදන අපනයන ආදායම




ඉහත ප්‍රස්තාර අංක 01 හි දැක්වෙන දත්තවලට අනුව පැහැදිලි වනුයේ පසුගිය කාලය තුළ රබර් සහ පොල් අපනයන ආදායමට වඩා තේ අපනයන ආදායම සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති බවයි. එමෙන් ම තේ සහ පොල් අපනයන ආදායම පෙර වසර වලට සාපේක්ෂව ඉහළ ගිය ද රබර් අපනයන ආදායමේ පසුබැසීමක් දැකගත හැක. පොල් අපනයන ආදායම 2007 වසරේ සිට 2011 වසර දක්වා අඛණ්ඩව ඉහළ ගොස් එතැන් සිට 2014 වසර දක්වා ස්ථාවර මට්ටමක පවතින බව හඳුනා ගත හැක. රබර් අපනයන ආදායම ද මෙම වසර අටක කාලය තුළ උච්චාවචනයන් සහිතව පසුබෑමක් ඇතිවී ඇති බව දැක ගත හැක. මෙසේ රබර් අපනයන ආදායම පහළ යාමට හේතු වී ඇත්තේ රබර් වගා අංශය තුළ ඵලදාව අඩුවීමයි. ඒ සඳහා කුඩා වතු හිමියන්ගේ කළමනාකාරීත්වයේ පවතින දුර්වලතාව, කිරි කැපිය හැකි දින ගණන සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම, වැඩි ඵලදාවක් ලබා දෙන රබර් වගාව අඩු මට්ටමක පැවතීම බලපා ඇත. වර්තමානයේ කෘෂි අංශයට සාපේක්ෂව කාර්මික අංශයේ දායකත්වය ඉහළ ගොස් ඇති අතර එයට හේතු වී ඇත්තේ අපනයන ආදායමට ප්‍රබල ලෙස බලපාන තේ, පොල් සහ රබර් නිෂ්පාදන පහළ අගයක් ගැනීමයි. පොහොර භාවිතය අඩු මට්ටමක පැවතීම, පස සංරක්ෂණය නොකිරීම මෙන් ම නිෂ්පාදන පිරිවැය වැඩි වීම තේ, පොල් සහ රබර් නිෂ්පාදන පරිමාව අඩු වීමටත් එමගින් ශ්‍රී ලංකා ආර්ථික වෘද්ධියට බලපාන අපනයන ආදායම පහළ යාමටත් හේතු වී ඇත. එම නිසා ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි භෝග නිෂ්පාදනය සහ ඵලදායීතාවය ඉහළ නංවා ගත යුතු අතර විදේශීය වෙළඳපොළ තුළින් එල්ලවන අභියෝගවලට සාර්තකව මුහුණදීම සඳහා තත්ත්වයෙන් සහ ගුණයෙන් උසස් නිෂ්පාදන කරා යොමු විය යුතු ය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය තේ ක්ෂේත්‍රයේ දියුණුව සඳහා සිය නියාමන සහ සංවර්ධන කටයුතු 2014 වසර තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තේ වගාව සඳහා ලබා දෙන සහනාධාර වැඩපිළිවෙල යටතේ 2014 වසර තුළ දී රුපියල් මිලියන 339 ක පිරිවැයක් දරන ලදී. ඒ

අනුව පසුගිය වසරවල දී මෙම සහනාධාර වැඩසටහන යටතේ නැවත වගාව හා නව වගා කටයුතු සිදු කරන ලදී. තේ කර්මාන්ත ශාලා නවීකරණ සහනාධාර වැඩසටහන යටතේ 2014 වසරේ දී කර්මාන්ත ශාලා 15 ක් නවීකරණය කළ අතර 2007 වසරේසිට මේ දක්වා ලංකාවේ ක්‍රියාත්මක තේ කර්මාන්තශාලා 713 න් කර්මාන්තශාලා 246 ක් මෙම වැඩසටහන යටතේ නවීකරණයට ආධාර කරන ලදී. තවදුරටත් ශ්‍රී ලංකා තේ මණ්ඩලය දේශීය තේ ජාත්‍යන්තරව ප්‍රචලිත කිරීම හා අලෙවිය සඳහා 2010 වසරේ දී අරමුදලක් පිහිට වූ අතර තේ අපනයනය මත පැනවූ විශේෂ බද්දක් මගින් මේ සඳහා අරමුදල් සම්පාදනය කරගන්නා ලදී. තවදුරටත් ශ්‍රී ලංකා තේ මණ්ඩලය "බෙස්ට් ලීෆ් 60" (best leaf 60) නමින් ව්‍යාපෘතියක් සාර්ථකව ක්‍රියාවට නැගූ අතර එමගින් කර්මාන්තශාලා වෙත ගෙන එන අමු තේ දළු අතරින් 60% ක ප්‍රමාණයක් හානි නොවූ තේ දළු ලෙස පවත්වා ගනිමින් තේ දළුවල ගුණාත්මක බව ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. එසේ ම තේ එකතු කිරිමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම සඳහා පියවර ගන්නා ලදී. ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා එක්ව 2012 - 2016 කාලපරිච්ඡේදය තුළදී තේ නිෂ්පාදනය තුළ බලශක්ති භාවිතය තවදුරටත් කාර්යක්ෂමව ඉහළ නැංවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

රබර් නිෂ්පාදනය සම්බන්ධයෙන් ගත් කළ දැනට පවත්නා රබර් වගාවන් හි ඵලදායිත්වය ඉහළ නැංවීම සහ අම්පාර, වව්නියාව හා මුලතිව් වැනි අනෙකුත් ප්‍රදේශ වල රබර් වගාව ව්‍යාප්ත කිරීම රබර් වගා අංශය වැඩි දියුණුව සඳහා ක්‍රියාවට නංවන ලද උපාය මාර්ගයක් විය. රබර් වගාව සඳහා වන සහනාධාරය 2014 වසර තුළ අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2015 වසර සඳහා වු අයවැය මගින් කුඩා රබර් වතු හිමියන් සඳහා සහතික මිලක් ලබා දිමේ වැඩසටහනක් යෝජනා කරන ලදි. මෙම වැඩසටහන යටතේ කොළඹ රබර් වෙන්දේසියේ ආර් එස්. එස් රබර් ප්‍රභේදයන් හි මාසික සාමාන්‍ය මිල සහ රජයේ සහතික මිල අතර වෙනස කුඩා රබර් වතු හිමියන් අතර ගෙවනු ලබයි. ඒ අනුව මෙම වැඩසටහන යටතේ 2015 ජනවාරි මස අවසන් වනවිට රුපියල් මිලියන හතරක මුදලක් ප්‍රතිලාභීන් 2000 ක් අතර බෙදා දෙන ලදී. 2013 වසරේ රබර් නිෂ්පාදනය 2012 වසරට සාපේක්ෂව 14.2% කින් පහළ ගිය අතර 2013 වසරට සාපේක්ෂව 2014 වසරේ දී රබර් නිෂ්පාදනය 24.4%කින් පහළ ගියේ ය. ගෝලීය ස්වාභාවික රබර් මිල ගණන්වල පහළ යාමේ ප්‍රවණතාවය ශ්‍රී ලංකාවේ රබර් මිල ගණන් පහළ යාමට බලපෑවේ ය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

පොල් වගා කරන ප්‍රදේශවල පැවති ඉහළ වර්ෂාපතනයේ ප්‍රතිලාභ පිළිබිඹු කරමින් 2013 වසරට සාපේක්ෂව 2014 වසරේදී පොල් නිෂ්පාදනය 14.2%කින් ඉහළ ගොස් ඇත. ගෝලීය වෙළෙඳපොළ තුළ පොල් සැපයුමේ හිඟය ඉහළ ගිය අතර අපනයන ඉල්ලුම සහ දේශීය පොල් නිෂ්පාදකයන්ගේ ඉහළ ඉල්ලුම 2014 වසරේ දී පොල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතීමට බලපාන ලදී. පොල් වගා කරන ප්‍රධාන ප්‍රදේශවල පැවති අඩු වර්ෂාපතනය හේතුවෙන් 2012 වසරට සාපේක්ෂව 2013 වසරේදි පොල් නිෂ්පාදනය 14.5%කින් පහළ ගියේ ය. පොල් මිල ගණන් 2013 වසරේ දී ඉහළ ගිය අතර ඒ සඳහා පහළ මට්ටමක පැවති පොල් නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත ඉහළ තරගය හේතු වී ඇත. 2001 න් පසු පොල් නිෂ්පාදනය සම්බන්ධයෙන් ඉහළ ම නිෂ්පාදනයක් වාර්තා කළේ 2012 වසරේදී ය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

## ප්‍රධාන කෘෂි අපනයන භෝග නිෂ්පාදනය මුහුණ දෙන අභියෝග

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි අපනයන භෝග වන තේ, පොල් සහ රබර් නිෂ්පාදනය අද වනවිට අභියෝග රැසකට මුහුණ දෙයි. ශ්‍රමිකයන්ගේ හිඟය, පරිපාලන දුර්වලතා, නුසුදුසු ඉඩම්වල තේ වගා කිරීම, නිසි ප්‍රමාණයට පොහොර නොයෙදීම සහ කළමණාකරණය පහත වැටීම නිසා තේ නිෂ්පාදනය සහ ඵලදායීතාවය පහත වැටීම සිදු වී ඇත. මෙකී හේතූන් මත තේ අපනයනයට ද බාධා එල්ල වේ.

රබර් වගාවට අවශ්‍ය උපකරණ මිලට ගැනීමේ අපහසුව, නිෂ්පාදන පිරිවැය අධික වීම, බොහෝ රබර් වගාවේ යෙදී සිටිනුයේ ගැමියන්වන අතර ඔවුන් තුළ ප්‍රමාණවත් දැනුමක් හා පුහුණුවක් රබර් වගාව සම්බන්ධයෙන් නොමැති වීම රබර් අපනයනය පහළ යාමට බලපා ඇත. දැනට ශ්‍රී ලංකාවේ රබර් වගාව මුහුණ පා ඇති ප්‍රධාන ගැටළුව වී ඇත්තේ කෘත්‍රිම රබර් නිසා ස්වාභාවික රබර්වලට ඇතිවන තරඟය යි. ඒ අනුව ලෝකයේ වර්තමාන රබර් පරිභෝජනය ගත් විට ඉන් 69%ක් පමණ කෘත්‍රිම රබර්වලින් යුක්ත වේ. මෙම හේතූන් රබර් නිෂ්පාදනය පහළ යාමටත් එමගින් අපනයනය පහළ යාමටත් බලපා ඇත (ජයකොඩි, 2008).

ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය මුහුණ දෙන අභියෝග පිළිබඳව ද සැලකිල්ලට ලක් කළ යුතු ය. පොල් අපනයන භෝගය මුහුණ දෙන අභියෝග ලෙස පොහොර භාවිතය අඩු වීම, දේශීය පරිභෝජනයට ගන්නා පොල් ප්‍රමාණය වැඩි නිසා අපනයනය සඳහා ඉතිරිවන පොල් ප්‍රමාණය අඩු වීම දැක්විය හැක. පළිබෝධ හා කෘමි උවදුර, වෙනත් ආදේශක වන එළවළු තෙල් වැනි දේ නිසා විදේශ වෙළෙඳපොළේ හොඳ මිලක් නොලැබී යාම, පොල් ඉඩම් කැබලි කර විකිණීම නිසා එහි නිෂ්පාදනය අඩු වීම පොල් අපනයනයට දැඩි අභියෝගයකි.

## ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි අපනයන ප්‍රවර්ධනය සඳහා මෑතකාලයේදී රජය විසින් ගෙන ඇති පියවර

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි අපනයන ප්‍රවර්ධනය සඳහා මෑතකාලයේදී රජය විසින් බදු සානුබල ලබා දීම, ආනයන හා විනිමය පාලනය ලිහිල් කිරීම, අපනයන අභිමුඛ කෘෂි නිෂ්පාදනය දිරිමත් කිරීම, විදේශ රටවල් සමඟ වෙළෙඳ ගිවිසුම් වලට එළඹීම, කෘෂි නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. එමෙන් ම රජය විසින් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ විධි විධාන යටතේ පොල් සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී (පොල් සංවර්ධන අධිකාරිය, 2015). විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ආර්ථික වෘද්ධිය ළඟා කර ගැනීමට අවශ්‍ය අපනයන ආදායම් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් කෘෂිකාර්මික අංශයට යටිතල පහසුකම් සපයා දිය යුතු අතර ප්‍රාග්ධන පහසුකම් සපයා ගත හැකි මාර්ග ප්‍රමාණවත් ලෙස සැපයීම, තාක්ෂණික උපදෙස් සහ ව්‍යාප්ති සේවාවන් සපයමින් කෘෂි කාර්මික අංශය තුළ තරඟකාරී තත්ත්වය වර්ධනය කිරීම සඳහා රජය මැදිහත් වීම වැදගත් වේ. ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ව්‍යුහාත්මක ගැළපුම් වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ දේශීය කෘෂි අංශය වාණිජ්‍යකරණය කිරීම සඳහා අපනයන සංවර්ධන සැලසුම්වල දී දේශීය කෘෂි නිෂ්පාදන භෝග වර්ධනය කෙරෙහි අවධානය යොමු කොට ඇති අතර එහිදී අපනයන ගම්මාන පිහිටුවීම ව්‍යාප්ත කරන ලදී. 2005

වසරේදි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව බැංකුව මගින් කෘෂි අංශයේ සංවර්ධනයට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයුමට යෝජනා කර ඇත. ඒ හැරුණු විට පසුගිය වසර තුළ ජාතික ඵලදායීතා වර්ධනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිළිබඳ යෝජනා ඉදිරිපත්වීම මගින් අපේක්ෂා කොට ඇත්තේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය තුළ තිරසර සංවර්ධනයක් අත්පත් කර ගැනීමට යි. ඒ හැරුණු විට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් තේ කර්මාන්ත ශාලා නවීකරණය සහ ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් දස ලක්ෂ 250ක් වෙන් කර ඇත. රබර් නිෂ්පාදන අංශය තුළ රබර් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සහණදායී මිලට වැසි ආවරණ සැපයීම සහ රබර් වගා අංශය තුළ පොහොර භාවිතය ඉහළ නැංවීම සඳහා රජය විසින් තුරු සවිය අරමුදල යටතේ මූල්‍යාධාර සපයනු ලබයි. එමෙන් ම රජය විසින් පොල් වගා සංවර්ධනය සඳහා "කප්රුක" නමින් අරමුදලක් ද පිහිටුවා ඇත. (හෙට්ටිආරච්චි, 2007).

**සමාලෝචනය**

සමස්ථයක් වශයෙන් ගත් කළ මෑත කාලයේ කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරීත්වය තුළින් පැහැදිලිව පෙන්නුම් කරන කරුණක් වන්නේ තාක්ෂණය හා පර්යේෂණය පදනම් කරගත් සංවර්ධනයක් ශ්‍රී ලංකාවේ සිදු වී නොමැති බවයි. එහි අනිවාර්ය ප්‍රතිඵලයක් වී ඇත්තේ සියවස් ගනනාවක් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය තේ, පොල් සහ රබර් වැනි ප්‍රධාන භෝග කිහිපයකට පමණක් සීමා වී තිබීම යි. එබැවින් අපනයන විවිධාංගීකරණය සිදුවන පරිදි සෙසු කෘෂි භෝග සඳහා ද සමාන බර තැබීමක් කළ යුතු වේ. ලෝකයේ දැනටමත් සංවර්ධනය කර ඇති තාක්ෂණය හා පර්යේෂණය ප්‍රයෝජනයට ගැනීමෙන් ඵලදායීතාවය ඉහළ නැංවීමට කටයුතු කළ යුතු ය. මෙසේ කෘෂි නිෂ්පාදන විවිධාංගීකරණය තුළින් හා ප්‍රධාන අපනයන භෝග ආශ්‍රිත නවෝත්පාදන සිදු කිරීම තුළින් අපනයන වෙළෙඳපොළ ප්‍රසාරණය කර ගත හැකි වේ. මෙලෙස අපනයන ඉපයුම්වල ධනාත්මක වර්ධනයට දායකවීම තුළින් විදේශ විනිමය උත්පාදනයටත් එමගින් වෙළෙඳ හිගය සංකෝචනය කර ගැනීමටත් හැකි වේ. තව ද ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි අපනයන අංශයට දේශීය විදේශීය ආයෝජන ලබා ගත යුතු ය. එමෙන් ම දේශීය හා විදේශීය වෙළෙඳපොළේ තරඟකාරීත්වය ඉහළ නංවා ගැනීම තුළින් කෘෂි අපනයන භෝග නිෂ්පාදකයින්ගේ සහ සේවා නියුක්තිකයන්ගේ ආදායම් සහ ජීවන තත්ත්වය ඉහළ නංවා ග්‍රාමීය සංවර්ධනය තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධනය වේගවත් කර ගත හැකිය. සංවර්ධිත යැයි සැලකෙන බොහෝ රටවල් ඒ තත්ත්වයට පත් වීමට මුලාරම්භය වුයේ කෘෂි අංශයේ ප්‍රගමණය යි. එහෙයින් ශ්‍රී ලංකාව ද එම සංවර්ධිත රටවල සාධනීය ගුණාංග භාවිතයට ගනිමින්, කෘෂි ආර්ථිකයකට හිමිකම් කියන රටක් වශයෙන් සිය සම්පත්වලින් උපරිම උපයෝජනයක් ලබා ගැනීමට ත් ඒ හරහා ආර්ථික සංවර්ධනය ලඟා කර ගැනීමට ත් කටයුතු කළ යුතු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

අපේ උරුමය (2015) , *"ශ්‍රී ලංකාවේ වතු වගාවේ ඉතිහාසය"*. http :// ourinherit ancesl.blogspot.com, viewed on 20 August 2015.

ඊරියගම, ටී. (1997), *"ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය"*, ජාතික අධ්‍යාපන පදනම, කොළඹ.

ජයකොඩි, එස් . කේ. (2007), *"ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභියෝග හා ප්‍රතිචාර"*, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය.

පොල් සංවර්ධන අධිකාරිය (2015), වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, http://www.cda.lk, viewed on 20 Auguest 2015.

සේනානායක, එච්. එම්. පී. (2008), *"කෘෂිකාර්මික ආර්ථිකවිද්‍යාව"*, ප්‍රින්ට් ඇන්ඩ් ප්‍රින්ට් ග්‍රැෆික්ස්, කොළඹ 10.

ශ්‍රී ලංකා මහ බැංකුව (2014), *''වාර්ෂික වාර්තාව''*,ශ්‍රී ලංකා මහ බැංකුව, ඇම්.ඩී. ගුණසේන මුද්‍රණකරුවෝ. කොළඹ 01.

හෙට්ටිආරච්චි, යූ. (2007), *"1977 න් පසු ශ්‍රී ලංකාවේ ආර්ථිකය"*, සරසවි මුද්‍රණාලය, දළුගම, කැලණිය.